**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලීසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 03 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/22

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක 1

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2024 පෙබරවාරි මස 21 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** එම්. එම්.කේ කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නවරත්න මාරසිංහ මහතා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණී ගිරිහාගම මහත්මිය | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | **1.** මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම්<br>**2.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉජාස් අහමඩ්<br>**3.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | පෙනී සිටීම පෙර පරිදි ලෙස සටහන් කරන ලදී. කෙසේ නමුත්, ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා, දෙවන විත්තිකරු වෙනුවෙන් චමින්ද අතුකෝරාල මහතාගේ උපදෙස් මත නීතිඥවරයෙක්ද, මා විසින් නම් නොදත් තවත් නීතිඥවරුන්ද පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | | |

| | | |
|---|---|---|
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදියෙකු සිටියේය | |

**2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?**

සම්පූර්ණ උද්‍යත ගොණුව අධිකරණට සහ විත්තියට **DVD** තැටියකින් ලබා දී ඇත**.** විධිමත් උද්‍යත ගොණු ලැබී ඇති බව විත්තිකාර පාර්ශවය සදහන් කරන ලදී.

පිළිගැනීම් නොමැති බවත් විත්තිකාර පාශර්වය සදහන් කරන ලදී. එමෙන්ම නඩු විභාගයේදී පිළිගැනීම් දැක්විය හැකි බවත් සදහන් විය.

ඇතැම් නඩු භාණ්ඩ වෙත විත්තිකරුවන්ගේ නීතිඥවරු ප්‍රවේශ වී ඇති බවටත් දැක්වීය. අධිචෝදනා පත්‍රයේ 2,4,5,7,8,9 යන නඩු භාණ්ඩ සම්බන්ධව සාක්ෂි විශේෂ විධි විධාන පනතේ 7(1) වගන්තිය යටතේ ප්‍රවේශය ලබාගෙන ඇති බවත් සදහන් විය.

පූර්ව නඩු විභාගය අවසන් කරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1**,** 2 හා 3 සදහා සිතාසි නිකුත් කරන මෙන් දැන්වීය.

මීළග දිනයේදී දමිළ භාෂා පරිවර්තක කැදවන ලෙසද ද දැන්වීය.

නඩු විභගය සඳහා 2024 ජූලි මස 16 වන දින හා 18 වන දින මෙම නඩුව කැඳවීමට නියම කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2024 ජූලි මස 16 වන දින

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**